# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date } 2024/07/01

පැමිණිලි පාර්ශවය :

**HRC/HO/607/24**

**1 වන පැමිණිලිකරු වන එම්. පත්බේරිය සහ 2, 3 පැමිණිලිකරුවන්**
**අංක 100, ඩී.එස්. සේනානායක මාවත,**
**කොළඹ 8.**

**HRC/HO/797/24**

**4 වන පැමිණිලිකරු වන එන්.එස්. තෙන්නකෝන් සහ 5, 6, 7, 8 පැමිණිලිකරුවන්**
**නො.66, පරණ පාර,**
**පන්නිපිටිය.**

**HRC/HO/798/24**

**9 වන පැමිණිලිකරු වන ඒ. සිරිවර්ධන**
**අංක 23A, ගල්හේන පාර,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

වගඋත්තරකාර පාර්ශවය :

**HRC/HO/607/24, 797/24 සහ 798/24**

1. **විදුහල්පති ,**
   **රාජකීය විද්‍යාලය, කොළඹ 07.**
2. **අධ්‍යක්ෂ ජාතික පාසල්,**
   **අධ්‍යාපන අමාත්‍යාංශය,**
   **ඉසුරුපාය, බත්තරමුල්ල.**

<u>පැමිණිලි අංක : **HRC/HO/607/24, 797/24 සහ 798/24**</u>

<u>පැමිණිල්ල</u>

ඉහත අංක 1 සිට 9 දක්වා වන සියලුම පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර සිටින්නේ ඔවුන් කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින් වන බවත්, මේ වන විට අ.පො.ස. උසස් පෙළ විභාගය අවසන් කර සිටින බවත් ය. ඔවුන් සියලු දෙනා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කරමින් ප්‍රකාශ කර සිටින්නේ කොළඹ රාජකීය විද්‍යාලයේ 2023/2024 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයට ශිෂ්‍ය නායකයින් තෝරාපත් කරගැනීම සඳහා අයදුම්පත් කැඳවා තිබූ අතර, ඔවුන් ඒ සඳහා විධිමත් පරිදි අයදුම් කළ නමුත්, තෝරාපත් කරගැනීමේ ක්‍රියාවලිය තුළ දී සිදු වූ විවිධ අක්‍රමිකතා හේතුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදු වී ඇති බවයි.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

එසේම, පැමිණිලිකරුවන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ විද්‍යාලයේ 2023/2024 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තෝරාපත් කරගත් ශිෂ්‍යයින්ගේ නම් ඇතුළත් ලේඛනයේ ඔවුන්ගේ නම් ඇතුළත්ව නොතිබීම හේතුවෙන් ඊට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ බව යි. එහිදී 1 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) විසින් ප්‍රකාශ කර සිටින්නේ අභියාචන මණ්ඩලය විසින් තමා ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තෝරාපත් කරගත් බවත්, ඔහු පළමු අවස්ථාවේදීම තේරීපත්වීම සඳහා සුදුසුකම්ලත් අයෙකු බව ඉන් පැහැදිලි වන බවත්, එසේ තේරීපත් වූ බවට දැනුම්දුන් දිනට පසුදින ශිෂ්‍ය නායකයින් අතුරෙන් ඉහළ ශිෂ්‍ය නායක මණ්ඩලය (Top Board) තෝරාගැනීම සඳහා වන ඡන්දය පැවති බැවින් ඔහු ශිෂ්‍ය නායකයෙකු ලෙස තේරීපත් වූ බවට අනෙක් ශිෂ්‍යයින් හට දැනුවත් වීමට ප්‍රමාණවත් කාලයක් නොලැබුණු බැවින් ඡන්දයේදී ඔහු හට අසාධාරණයක් සිදු වූ බවත් ය. තවද, මෙලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හේතුවෙන් විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් තමා හට කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව විවිධ වෙනස්කම් සහ පීඩනයන් සිදු කරන බවත්, තමා හට ශිෂ්‍ය නායකයෙකු ලෙස ඉටු කිරීම සඳහා කිසිදු කාර්යයක් නොපැවරූ බවත් 1 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) විසින් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, 2 සිට 9 දක්වා වන පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර සිටින්නේ අභියාචන මණ්ඩලය විසින් ද ඔවුන්ව තෝරාපත් කර නොගත් බවයි.

තවද, පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර සිටින්නේ 2023/2024 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය තෝරාපත් කරගැනීම සඳහා 1වන වගඋත්තරකරු වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් අනුගමනය කරන ලද කාර්යපටිපාටිය විනිවිදභාවයකින් තොර වූවක් බවයි. එසේම, ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තේරීපත් වූ ශිෂ්‍යයින් අතර අවම පැමිණීමක් පවත්වාගත් ශිෂ්‍යයින් මෙන්ම විවිධ විනය ගැටලු හේතුවෙන් දඬුවමට ලක් වූ ශිෂ්‍යයින් ද සිටින බවට පැමිණිලිකරුවන් විසින් කරුණු දක්වා ඇත. තවද, විෂය බාහිර ක්‍රියාකාරකම් සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා අවම සහභාගීත්වයක් තිබූ ඇතැම් ශිෂ්‍යයින් හට අත්තනෝමතික අයුරින් ලකුණු ලබා දී ඔවුන් හට ශිෂ්‍ය නායක තනතුරු ප්‍රදානය කර ඇති බවද පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර ඇත.

තවද, 2023/2024 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයට අයදුම් කිරීම සඳහා 1වන වගඋත්තරකරු වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් ලබාදෙනු ලැබූ අයදුම්පත්‍රය ද නිසි අයුරින් සකස් කර නොතිබීම හේතුවෙන් ලබාගත් ඇතැම් ජයග්‍රහණයන් පිළිබඳව සඳහන් කිරීමට ඒ තුළ ඉඩකඩක් වෙන්ව නොපැවති බවට ද පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර ඇත. එසේම, ලකුණු ලබාදීමේ පටිපාටිය පිළිබඳව ද කිසිදු විටෙක ඔවුන්ව දැනුවත් නොකළ බවත්, කොමිෂන් සභාවට පැමිණිලි කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ මැදිහත් වීම මත අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය පිළිබඳව දැනුවත් වූ බවත්, එහිදී එකී පටිපාටිය තුළ බොහෝ සංකීර්ණතාවයන් පවතින බවට හඳුනාගත් බවත් පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර ඇත.

එසේහෙයින්, පැමිණිලිකරුවන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිලි ඉදිරිපත් කරමින් 2023/2024 ජොෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය තේරීමේ දී 1වන වගඋත්තරකරු වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් සිදු කරන ලද අක්‍රමිකතාවයන් හේතුවෙන් එය නැවත සලකා බලා ඔවුන් හට සාධාරණයක් ඉටු කරදෙන ලෙසට ඉල්ලා ඇත.

මෙම පැමිණිලි වලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.03.01, 2024.03.05, 2024.03.15, 2024.03.20, 2024.04.04 සහ 2024.05.13 යන දිනයන්හිදී පරීක්ෂණ කටයුතු සිදු කර ඇත. එහිදී 2024.03.01 දින පැවති පරීක්ෂණය සඳහා පැමිණිලිකරුවන්, 1 වන වගඋත්තරකරු සහ 2 වන වගඋත්තරකරු යන සියලු පාර්ශවයන් සහභාගී වූ අතර, සෙසු දිනවලදී පැමිණිලිකරුවන් සහ 1 වන වගඋත්තරකරු පමණක් කැඳවා පරීක්ෂණ කටයුතු සිදු කර ඇත.

<u>1 වන වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලයේ කරුණු දැක්වීම</u>

01 වන වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලය නියෝජනය කරමින් පරීක්ෂණ සඳහා සහභාගී වූ නියෝජ්‍ය විදුහල්පතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ පෙර වසරවලදී මෙන් නොව 2023/2024 ජොෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා අයදුම්පත් යොමු කරන ලද සියලුම ශිෂ්‍යයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබූ බවයි. එසේම, ශිෂ්‍ය නායකයින් අසූ දෙනෙකු (80) තෝරාපත් කරගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ නමුත්, අභියාචන සලකා බැලීමේදී යම් ශිෂ්‍යයෙකු හට යම් අසාධාරණයක් සිදු වී ඇති බවට අනාවරණය වුවහොත් එම ශිෂ්‍යයින්ට ද අවස්ථාව ලබාදෙන බවත්, එහිදී බඳවාගනු ලබන ශිෂ්‍ය නායකයින් ගණන අසූව (80) ඉක්මවන බව ද ප්‍රකාශ කර ඇත.

තවද, සම්මුඛ පරීක්ෂණයට ශිෂ්‍යයින් යොමු කිරීමට ප්‍රථම ඔවුන් රැගෙන එනු ලබන සියලුම ලේඛන පරීක්ෂා කිරීම සඳහා ගුරුවරයෙකු සහ ශිෂ්‍ය නායකයෙකු සිටි නමුත්, ඔවුන් විසින් ලකුණු ලබාදීමක් නොකරන ලද බවත්, අදාළ ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීම පමණක් සිදු කරන ලද බවත් ප්‍රකාශ කර ඇත. එසේම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරුන්, අංශභාර ගුරුවරුන් සහ උසස් පෙළ ගුරුවරුන්ගෙන් සමන්විත වූ බවත් අදාළ ලකුණු ලබාදීම ඔවුන් විසින් සිදු කරන ලද බවත් දක්වා ඇත. එහිදී අදාළ ශිෂ්‍යයාගේ අධ්‍යයන කටයුතු, විෂය බාහිර ක්‍රියාකාරකම්, විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ සම්මුඛ පරීක්ෂණයේ දී ඔවුන් දක්වන භාෂා හැකියාවන්, නායකත්ව ලක්ෂණ ආදිය සඳහා ලකුණු ලබා දී එම ලකුණු ප්‍රතිශතයක් ලෙස ගෙන අවසාන ලකුණ ගණනය කරන ලද බවත් ප්‍රකාශ කර ඇත. එසේම, එකී ගණනය කිරීම් අවසානයේ ලකුණු 27 කඩඉම් ලකුණ ලෙස සලකා එම ලකුණු ප්‍රමාණය ඉක්මවූ සියලු ශිෂ්‍යයින් ජොෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තෝරාපත් කරගත් බවත් දක්වා ඇත.

01 වන වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලය නියෝජනය කරමින් පරීක්ෂණ සඳහා සහභාගී වූ නියෝජ්‍ය විදුහල්පතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද්දේ විද්‍යාලය විසින් 2023/2024 ජොෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය තෝරාපත් කරගැනීමේ දී පැමිණිලිකරුවන් විසින් දක්වන ලද ආකාරයේ කිසිදු අක්‍රමිකතාවයක් සිදු කර නොමැති බවත්, අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය ප්‍රකාරව නිසි පරිදි ලකුණු

ලබා දී අදාළ තෝරාපත් කරගැනීම් සිදු කර ඇති බවත් ය. තවද, විද්‍යාලය විසින් අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය පිළිබඳව ශිෂ්‍යයින් දැනුවත් නොකරනු ලබන්නේ සියලු ශිෂ්‍යයින් විසින් ඊට අනුගතව පමණක් ක්‍රියා කිරීමේ ප්‍රවණතායක් උද්ගත වීම වැළැක්වීම සඳහා බව ද ප්‍රකාශ කර ඇත.

**<u>02 වන වගඋත්තරකාර අධ්‍යාපන අමාත්‍යාංශයේ කරුණු දැක්වීම</u>**

02 වන වගඋත්තරකාර අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් අංක ED/1/6/12/HRC/2024/1 සහ 2024.03.04 දිනැති වාර්තාව යොමු කරමින් පාසල්වල ශිෂ්‍ය නායකයින් තේරීම අභ්‍යන්තර ක්‍රියාවලියක් වන බවත්, එහිදී අදාළ පාසල විසින් සකස් කරනු ලබන පොදු නිර්ණායක වලට අනුකූලව සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් ලබන ශිෂ්‍යයින්, ශිෂ්‍ය නායකයින් වශයෙන් තෝරා පත් කරගැනීම සිදු වන බවත් දක්වා ඇත.

එසේම, කො/ රාජකීය විද්‍යාලයේ ශිෂ්‍ය නායකයින් තේරීමේදී මෙම පැමිණිලිකාර දරුවන් යම් අසාධාරණයකට ලක් වී ඇති බව නිරීක්ෂණය වන්නේ නම්, සුදුසුකම් පරීක්ෂා කර බලා එම අසාධාරණයට ලක් වූ සිසුන් හට ශිෂ්‍ය නායක තනතුරු ලබාදීම සුදුසු වන බවත්, එසේ නොමැතිව, අසාධාරණයක් සිදු වූ බව නිරීක්ෂණය නොවන සිසුන් හට ශිෂ්‍ය නායක තනතුරු ලබාදීම නිර්දේශ කළහොත් එය සමස්ත පාසල් පද්ධතියට ම වැරදි පූර්වාදර්ශයක් වනු ඇති බවත් සඳහන් කර ඇත.

තවද, ශිෂ්‍ය නායකයින් තේරීමේදී ඇතිවන ගැටලු මඟ හරවා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සකස් කරනු ලබන මාර්ගෝපදේශ සංග්‍රහයක් කඩිනමින් පාසල් වෙත ලබාදීමට සැලසුම් කර ඇති බව ද එකී වාර්තාව තුළින් දක්වා ඇති අතර ඒ පිළිබඳව මෙම පැමිණිල්ලට අදාළව 2024.03.01 වන දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේ දී ඒ සඳහා සහභාගී වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂිකාවන් දෙදෙනා විසින් ද ප්‍රකාශ කර ඇත.

**<u>නිරීක්ෂණ</u>**

1 සිට 9 දක්වා වන පැමිණිලිකරුවන් සියලු දෙනා කො/ රාජකීය විද්‍යාලයේ 2023/2024 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා අයදුම්පත් යොමු කර ඇති බවත්, ඔවුන් කිසිවෙකු මුල් අවස්ථාවේදී ශිෂ්‍ය නායකයින් ලෙස තේරී පත් නොවූ බැවින් ඊට එරෙහිව අභියාචනා යොමු කර ඇති බවත්, එහිදී 1 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) පමණක් තේරී පත් වී ඇති බවත්, 2 සිට 9 දක්වා වන අනෙක් පැමිණිලිකරුවන් තේරී පත් වී නොමැති බවත්, පැමිණිලිකරුවන්ගේ කරුණු දැක්වීම සහ 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලිකරුවන්ගේ අයදුම්පත් සහ ලකුණු ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ.

එසේම, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද අවසන් ලකුණු ලේඛනය අනුව පැමිණිලිකරුවන් විසින් පහත පරිදි ලකුණු ලබා ඇති බව නිරීක්ෂණය වේ.

| | |
|---|---|
| 1 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) | - 34.39 |
| 2 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 95) | - 21.07 |
| 3 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 107) | - 22.67 |
| 4 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 24) | - 24.43 |
| 5 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 67) | - 25.66 |
| 6 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 69) | - 25.35 |
| 7 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 57) | - 18.19 |
| 8 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 62) | - 23.46 |
| 9 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 138) | - 18.33 |

ඒ අනුව කඩඉම් ලකුණ වන ලකුණු 27 ඉක්මවූ 1වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) පමණක් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තේරී පත්ව ඇති බව නිරීක්ෂණය වේ.

2 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 95) විසින් 27.03.2024 දිනැතිව දිව්රුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ඔහු හට ලකුණු ලැබිය යුතු අංශයන් සහ ලකුණු ප්‍රමාණයන් දක්වා ඇත. එකී දිව්රුම් ප්‍රකාශයට පිළිතුරු ලබා දෙමින් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ප්‍රකාශ කර ඇත්තේ එම සියලු ජයග්‍රහණයන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචන මණ්ඩලය විසින් සලකා බලා ඇති බවයි.

එසේවුවද, 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා අන්තර් පාසල් හොකී තරඟාවලියෙහි (Hockey Sri Lanka Inter Schools) ප්‍රථම ස්ථානය ලැබීම වෙනුවෙන් ලකුණු 10ක් සහ ජල රොකට්ටුව (Water Rocket) දියත් කිරීමේ ගිනස් වාර්තාව සඳහා සහභාගීවීම වෙනුවෙන් ලකුණු 15ක් හිමිවිය යුතු බවට 2 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 95) විසින් සිය දිව්රුම් ප්‍රකාශය තුළ සඳහන් කරමින් කරුණු දක්වා තිබුණ ද, එකී ජයග්‍රහණයන් පිළිබඳව විද්‍යාලය වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය තුළ ඔහු විසින් සඳහන් කර නොමැති බව එම අයදුම්පත්‍රය පරීක්ෂා කිරීමේදී කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, 2021 වර්ෂයේදී Royal College Tamil Karnatic Music Society හි සාමාජිකයෙකුව කටයුතු කිරීම වෙනුවෙන් ලකුණු 1ක් සහ 2021 වර්ෂයේදී Royal College Tamil Literary Association හි සාමාජිකයෙකුව කටයුතු කිරීම වෙනුවෙන් ලකුණු 1ක් හිමිවිය යුතු බවට 2 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 95) විසින් සිය දිව්රුම් ප්‍රකාශය තුළ සඳහන් කරමින් කරුණු දක්වා තිබුණ ද, එම සාමාජිකත්වයන් සනාථ කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කර නොමැති වීම හේතුවෙන් ඔහු හට ඒ සඳහා ලකුණු ලැබී නොමැති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එසේම, 2 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 95) විසින් විද්‍යාලය වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සහ අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීමේ දී විද්‍යාලයේ ලකුණු ලබාදීමේ පටිපාටිය ප්‍රකාරව අයදුම්පත්‍රය සඳහා ඔහු හට හිමිවිය යුතු මුළු අගය 83 නොව 86 ලෙස නිවරදි විය යුතු බවත්, ඒ අනුව ඔහු හට හිමිවන අවසන් ලකුණ 21.07 නොව 21.38 ලෙස නිවරදි විය යුතු බවත්, එලෙස නිවරදි කරනු ලැබුව ද 2 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 95) හට කඩඉම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබාගත නොහැකි බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

4 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 24) විසින් 2024.03.28 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය තුළ දී සහ 2024.04.04 වන දින පැවති පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලද කරුණක් වූයේ ඔහු 2023 වර්ෂයේ තුන්වන වාර විභාගයේදී පන්තියේ පළමුවැනියා වූ බවත්, එය සඳහන් කිරීම සඳහා අයදුම්පත්‍රය තුළ ඉඩක් වෙන් වී නොතිබුණු බවත්, එසේ හෙයින් ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ඊට හිමිවිය යුතු ලකුණු 3 නොලැබුණු බවත් ය. එහෙත් 2024.04.04 වන දින පැවති පරීක්ෂණයේ දී ඉහත කී කරුණ සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලයේ මතය වූයේ අයදුම්පත්‍රයේ අංක 14 යටතේ තුන්වන වාර විභාගයේදී පන්තියේ පළමුවැනියා වූ බව සඳහන් කළ හැකිව තිබූ බවයි.

එසේවුවද, අයදුම්පත්‍රයේ අංක 14 හි සඳහන්ව ඇත්තේ Special Prizes presented at the Royal College Prize Giving ලෙස ය. ඒ අනුව ඒ යටතේ සඳහන් කළ හැකි වන්නේ විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ලබාගත් ත්‍යාගයන් පිළිබඳව ය. 2023 වර්ෂයට අදාළව විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයක් නොපැවැත්වුණු බව 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් 2024.04.04 වන දින පැවති පරීක්ෂණයේ දී කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. එවැනි පසුබිමක් තුළ 2023 වර්ෂයේ තුන්වන වාර විභාගයේදී පන්තියේ පළමුවැනියා වූ බව අයදුම්පත්‍රයේ අංක 14 යටතේ සඳහන් කළ යුතු බවට වන 1 වන වගඋත්තරකාර පාර්ශවයේ මතය පිළිගත නොහැකි බවත්, එය සඳහන් කිරීමට අයදුම්පත්‍රය තුළ ඉඩක් වෙන් වී නොතිබුණු බවට වන 4 වන පැමිණිලිකරුගේ ප්‍රකාශය පිළිගත හැකි බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, 4 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 24) විසින් භෞතික විද්‍යාව සඳහා වැඩිම ලකුණු ලබාගැනීම වෙනුවෙන් හිමිවිය යුතු ලකුණු 5 ද ඔහු හට ලබා දී නොමැති බව ප්‍රකාශ කර ඇත. මේ පිළිබඳව 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් දක්වා ඇත්තේ විෂය ත්‍යාග පිරිනැමෙන්නේ සියලුම පන්තිවල ශිෂ්‍යයින්ගෙන් අදාළ විෂයට වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍යයාට බවත්, භෞතික විද්‍යාව සඳහා 4 වන පැමිණිලිකරුට වඩා ලකුණු ලබාගත් ශිෂ්‍යයෙකු සිටින බැවින් මොහු හට එකී ලකුණු ලබා නොදුන් බවත් ය. 4 වන පැමිණිලිකරුගේ ශිෂ්‍ය වාර්තා පොත (Student Record Book) පරීක්ෂා කිරීමේදී ඔහු විසින් 2023 වර්ෂයේ තුන්වන වාර විභාගයේදී භෞතික විද්‍යාව සඳහා ලකුණු 81ක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ. එසේම, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද ලකුණු ලේඛනය අනුව භෞතික විද්‍යාව සඳහා වැඩිම

ලකුණු ලෙස ලකුණු 88ක් ලබාගත් ශිෂ්‍යයෙකු සිටින බව පෙනී යන හෙයින් 4 වන පැමිණිලිකරු හට භෞතික විද්‍යාව සඳහා ලකුණු ලබා නොදීම යුක්තිසහගත බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

5 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 67) විසින් 2024.03.28 වන දිනැතිව කොමිෂන් සභාව වෙත දිව්රුම් ප්‍රකාශයක් ලබාදෙමින් ඔහු හට ඇතැම් සුදුසුකම් වලට අදාළව ලැබිය යුතු ලකුණු ලැබී නොමැති බවත්, අදාළ පත්කිරීම් සිදු කිරීමේ දී යම් අකටයුත්තක් සහ අක්‍රමිකතාවයක් සිදුව ඇති බවට ඔහු හට පෙනී යන බවත් ප්‍රකාශ කර ඇත. එකී දිව්රුම් ප්‍රකාශය සඳහා පිළිතුරු ලබාදෙමින් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් දක්වා ඇත්තේ එවැනි කිසිදු අකටයුත්තක් සිදු වී නොමැති බවයි.

එහෙත් 5 වන පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය පරීක්ෂා කිරීමේ දී පහත තනතුරු සඳහා ලකුණු ලැබී නොමැති බව කොමිෂන් සභාව විසින් අනාවරණය කරගන්නා ලදී.

- Project Chairman - Unique 22 , 2022 (page no. 11 of application no. 67)
- Project Chairman - Grade 1 blessing , 2020 (page no. 19 of application no. 67)
- Project Chairman - Grade 10/11 Buddhist Knowledge Development Programme, 2020 (page no. 19 of application no. 67)
- Project Chairman - Drama Workshop for Grade 11 students, 2019 (page no. 21 of application no. 67)

1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ලකුණු ලබාදීමේ පටිපාටිය තුළ සඳහන් කර ඇත්තේ යම් ව්‍යාපෘතියක සභාපතිවරයා ලෙස කටයුතු කිරීම වෙනුවෙන් ලකුණු ලබාගැනීමට නම් එකී ව්‍යාපෘතිය විද්‍යාලයේ වර්ණ රාත්‍රියේ දී පිළිගත් ව්‍යාපෘතියක් විය යුතු බවයි. එකී ව්‍යාපෘති පිළිබඳව 2024.04.09 වන දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව විසින් සිදු කළ විමසීමේ දී, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් 2024.04.29 දිනැති ලිපිය යොමු කරමින් Clubs and Societies භාර ආචාර්යවරයා විසින් නිර්දේශ කරනු ලබන හා පාසල විසින් අනුමත කර ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ලකුණු ලබාදෙන බවට දක්වා ඇත. එසේවුවද, එය ප්‍රමාණවත් පිළිතුරක් නොවූ බැවින් 2024.05.13 වන දින පැවති පරීක්ෂණයේදී එලෙස Clubs and Societies භාර ආචාර්යවරයා විසින් නිර්දේශ කරනු ලබන හා පාසල විසින් අනුමත කර ක්‍රියාත්මක කරන ව්‍යාපෘති මොනවාද යන්න නම් වශයෙන් පැහැදිලි කරන ලෙසට දැන්වූ විට කො/ රාජකීය විද්‍යාලයේ Clubs and Societies විශාල ප්‍රමාණයක් පවතින බැවින් එලෙස නම් කිරීම අපහසු බවත්, එවැනි ව්‍යාපෘතීන්හි නම් ඇතුළත් ලේඛනයක් විද්‍යාලය සතු නොවන බවත් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ප්‍රකාශ කරන ලදී.

එසේම, 5 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 67) හට ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා ලකුණු නොලැබී ඇත්තේ ඒවා විද්‍යාලය විසින් අනුමත නොකරන ලද ව්‍යාපෘති නිසා විය හැකි බවට ද 2024.05.13 වන දින පැවති පරීක්ෂණයේ දී 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ප්‍රකාශ කර ඇත. එසේවුවද, 5 වන පැමිණිලිකරුගේ ශිෂ්‍ය වාර්තා පොත පරීක්ෂා කර බැලීමේදී ඔහු විසින් ඉහත කී ව්‍යාපෘතීන්හි Project Chairman ලෙස කටයුතු කළ බව සනාථ කරමින් අදාළ සංගමය භාර ආචාර්යවරයා විසින් සිය අත්සන තබා ඇති බව නිරීක්ෂණය වේ. එසේහෙයින් එකී ව්‍යාපෘති සඳහා ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ලකුණු 11ක ප්‍රමාණයක් 5 වන පැමිණිලිකරු වෙත ලැබිය යුතු බවත්, ඒ අනුව Co-curricular activities සඳහා වන ලකුණු ප්‍රමාණය 72 ලෙස නිවරදි විය යුතු බවත්, ඒ අනුව ඔහුගේ අවසාන ලකුණු ප්‍රමාණය 27.41 ලෙස නිවරදි විය යුතු බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. එලෙස නිවරදි කළ විට 5 වන පැමිණිලිකරු ශිෂ්‍ය නායක මණ්ඩලය තේරීමේ කඩඉම් ලකුණ වන ලකුණු 27 ඉක්මවා ලකුණු ලබන බැවින් ඔහු ශිෂ්‍ය නායකයෙකු ලෙස තෝරාපත් කරගත යුතුව තිබූ ශිෂ්‍යයෙකු බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

6 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 69) විසින් 2024.03.28 දිනැති දිවුරුම් ප්‍රකාශය යොමු කරමින් විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද ලකුණු ලේඛනය ප්‍රකාරව ඔහු හට විෂය බාහිර ක්‍රියාකරකම් සඳහා කිසිදු ලකුණක් හිමිවී නොමැති නමුත්, ඔහු විසින් අයදුම්පත්‍රයට සාක්ෂි සහිතව 2017 දී පාසැල් ශිෂ්‍යභට කණ්ඩායමේ සාමාජිකයෙකුව කටයුතු කිරීම සහ 2016 දී බැඩ්මින්ටන් B කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ක්‍රීඩා කිරීම සම්බන්ධව ඇතුළත් කළ බව ප්‍රකාශ කර ඇත.

6 වන පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සහ අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීමේදී ඔහු විසින් ප්‍රකාශ කරන ලද ඉහත කරුණු නිවරදි බව නිරීක්ෂණය වේ. එසේම, 6 වන පැමිණිලිකරු හට 2017 වර්ෂයේදී පාසැල් ශිෂ්‍යභට කණ්ඩායමේ සාමාජිකයෙකුව කටයුතු කිරීම වෙනුවෙන් හිමිවිය යුතු ලකුණු 1 ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ. එසේම, එකී ලකුණු 1 ලබාදුන් විට ඔහුගේ අවසාන මුළු ලකුණු සංඛ්‍යාව 25.35 නොව 25.52 ලෙස නිවරදි විය යුතු බවත්, එලෙස නිවරදි කරනු ලැබුව ද 6 වන පැමිණිලිකරු හට කඩඉම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබාගත නොහැකි බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එමෙන්ම, 2016 දී බැඩ්මින්ටන් B කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ක්‍රීඩා කිරීම පිළිබඳව අයදුම්පත්‍රය තුළ ඇතුළත් කිරීමේදී Age Group - Under 13 ලෙස දක්වා ඇති අතර 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කර ඇති ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ක්‍රීඩා සඳහා ලකුණු හිමි වන්නේ Under 15, Under 17 සහ Under 19 වයස් කාණ්ඩ යටතේ පමණක් වන අතර Under 13 සඳහා ලකුණු හිමි නොවන බව නිරීක්ෂණය වේ.

එසේම, විෂය සමගාමී ක්‍රියාකාරකම් යටතේ 2016 දී පාසල නියෝජනය කරමින් කලාප සංගීත තරඟාවලියට සහභාගී වී දෙවන ස්ථානය ලබා ගැනීමට අදාළව ලකුණු ලබාදී නොමැති බව ද 6 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 69) විසින් ප්‍රකාශ කර ඇත. කොමිෂන් සභාව වෙත ලැබී ඇති අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේ දී Non-Sporting Competitions යටතේ 2016 වර්ෂයේදී ලැබූ ජයග්‍රහණ සඳහා

කිසිදු ශිෂ්‍යයෙකු හට විද්‍යාලය විසින් ලකුණු ලබා දී නොමැති බව නිරීක්ෂණය වන බැවින් 6 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 69) හට අසාධාරණයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය වේ.

තවද, 7 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 57) විසින් 2024.03.28 දිනැති දිව්රුම් ප්‍රකාශය ඉදිරිපත් කරමින් 2019 වර්ෂයේදී තුන්වන කාණ්ඩ ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ක්‍රීඩා කිරීමට අදාළව හිමි විය යුතු ලකුණු ලබා දී නොමැති බවට ප්‍රකාශ කර ඇත.ඔහුගේ අයදුම්පත්‍රය සහ අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීමේ දී සනාථ කිරීමේ ලේඛන ද ඉදිරිපත් කර තිබිය දී 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඊට අදාළ ලකුණු ලබා දී නොමැති බවත්, එම ලකුණු ලබාදෙනු ලැබුව ද 7 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 57) හට කඩඉම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබාගත නොහැකි බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරුවන් විසින් ස්වකීය දිව්රුම් ප්‍රකාශ තුළින් මෙන්ම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණවලදී ද ඉස්මතු කරන ලද කාරණයක් වූයේ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තෝරාපත් කරගැනීමට සුදුසු නොවන ශිෂ්‍යයින්, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් තෝරාපත් කරගෙන ඇති බවත්, ඇතැම් ශිෂ්‍යයින් සඳහා අසාධාරණ ලෙස ලකුණු ලබා දී ඇති බවත් ය.

ඒ අනුව අයදුම්පත්‍ර අංක 155 දරන ශිෂ්‍යයා පාසලේ කිසිදු ක්‍රීඩාවකට සහභාගී වී නොමැති බවත්, ඔහු පාසලේ කිසිදු වර්ණලාභියෙකු ද නොවන බවත්, එවැනි පසුබිමක් තුළ ඔහු හට ක්‍රීඩා සඳහා ලකුණු 90ක් ලැබී තිබීම ප්‍රශ්න සහගත බවත් 4 සිට 9 දක්වා වන පැමිණිලිකරුවන් විසින් ස්වකීය දිව්රුම් ප්‍රකාශ තුළින් දක්වා ඇත. මෙයට පිළිතුරු ලෙස 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් සඳහන් කර ඇත්තේ සියලුම අයදුම්කරුවන් හට එකම ක්‍රමවේදයක් මත ලකුණු ලබාදීම සිදු කර ඇති බවයි.

ඉහත කී අයදුම්පත්‍ර අංක 155 දරන ශිෂ්‍යයාගේ අයදුම්පත්‍රය සහ අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීමේදී ඔහු හට විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ලකුණු 90ක් ලබා දී ඇති බවත්, පැමිණිලිකරුවන් විසින් ඔහු හට ක්‍රීඩා සඳහා ලකුණු 90ක් ලැබී ඇති බවට සිදු කරන ලද ප්‍රකාශය සත්‍ය බවත් නිරීක්ෂණය වේ. එසේවුවද, එම ශිෂ්‍යයාගේ ශිෂ්‍ය වාර්තා පොත තුළ ඔහු සහභාගී වූ ක්‍රීඩා පිළිබඳව තොරතුරු ඇතුළත්ව තිබෙන බවත්, අදාළ ගුරුභවතුන් විසින් ඒවා සනාථ කරමින් සිය අත්සන් යොදා ඇති බවත් නිරීක්ෂණය වන බැවින් එකී ශිෂ්‍යයා විසින් පාසලේ කිසිදු ක්‍රීඩාවකට සහභාගී වී නොමැති බවට වන පැමිණිකරුවන්ගේ ප්‍රකාශය පිළිගැනීම ගැටලු සහගත වන බව නිරීක්ෂණය වේ. එහෙත්, අයදුම්පත්‍රයේ Sports Achievements යටතේ 2020 දී එල්ලේ 20න් පහළ කලාප මට්ටමේ ජයග්‍රහණයක් ලබාගැනීම වෙනුවෙන් ලකුණු 4ක් ලබා දී තිබුණ ද, එය සනාථ වන ආකාරයේ කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රශ්න සහගත පත්කිරීම් ලෙස ප්‍රකාශ කරන ලද අයදුම්පත්‍ර අංක 31 සහ 154 දරන ශිෂ්‍යයින්ගේ අයදුම්පත්‍ර සහ ලේඛන ඇතුළත් ගොනු ද කොමිෂන් සභාව විසින් පරීක්ෂා

කරන ලද අතර එහිදී සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලකුණු ලබා දී ඇති අවස්ථාවන් කිහිපයක් නිරීක්ෂණය වේ.

ඒ අනුව අයදුම්පත්‍ර අංක 31 දරන ශිෂ්‍යයා හට විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ලකුණු 05ක් සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු 06ක්, සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර එම ක්‍රියාකාරකම් පහතින් සඳහන් කර ඇත.

**Sports Achievements**

- Hockey - 2023 - Under 19 - B Team - Member - 2 marks
- Hockey - 2023 - Under 19 - 1st Runners up in Hockey League -23 - 3 marks

**Clubs and Societies**

- Royal College Chemistry Club - 2022 - C - Project Chairman of,
  - Lab Renovation Project - 1 mark
  - A/L Seminar'22 - 1 mark
  - Mendalivian Quiz'22 - 1 mark
  - Inorganic Short Notes' 22 - 1 mark
- Royal College Chemistry Club - 2021- B - Member - 1 mark
- Preliminary Care Unit - 2019-2022 - Member - 1 mark

ඉහතින් දක්වා ඇති විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලබා දී ඇති ලකුණු 05 අඩු කළ විට එම ශිෂ්‍යයා හට විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා හිමි වන ලකුණු ප්‍රමාණය 28 ලෙසත්, විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලබා දී ඇති ලකුණු 06 අඩු කළ විට එම ශිෂ්‍යයා හට විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා හිමි වන ලකුණු ප්‍රමාණය 34 ලෙසත් නිවරදි විය යුතු බවත්, එවිට ඔහුගේ අවසාන මුළු ලකුණු සංඛ්‍යාව 28.04 නොව 26.11 ලෙස නිවරදි විය යුතු බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එසේම, අයදුම්පත්‍ර අංක 154 දරන ශිෂ්‍යයා හට විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ලකුණු 03ක් සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු 13ක්, සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර එම ක්‍රියාකාරකම් පහතින් සඳහන් කර ඇත.

**Sports Achievements**

- Wushu - 2016 - Under 15 - A Team - Member - 3 marks

## Clubs and Societies

- Photographic Society - 2022 - C- Project Chairman,
  - Aperture 22 - 1 mark
  - Photobooth 22 - 1 mark
  - Explora 22 - 1 mark
- Young Inventor's Club - 2022 - B - Member - 1 mark
- Young Inventor's Club - 2021 - B - Member - 1 mark
- Young Inventor's Club - 2019 - B - Member - 1 mark
- Science Association - 2022- C - Member - 1 mark
- Science Association - 2021- C - Member - 1 mark
- Science Association - 2020 - C - Member - 1 mark
- YIC 'Jarvis" Team (Building) - 2020 - Member - 1 mark
- Young Inventor's Club - 2020 - Leo Building Competition 1st Place - 3 marks

ඉහතින් දක්වා ඇති විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලබා දී ඇති ලකුණු 03 අඩු කළ විට එම ශිෂ්‍යයා හට විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා හිමි වන ලකුණු ප්‍රමාණය 08 ලෙසත්, විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සනාථ කිරීමේ ලේඛන නොමැතිව ලබා දී ඇති ලකුණු 13 අඩු කළ විට එම ශිෂ්‍යයා හට විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා හිමි වන ලකුණු ප්‍රමාණය 40 ලෙසත් නිවරදි විය යුතු බවත්, එවිට ඔහුගේ අවසාන මුළු ලකුණු සංඛ්‍යාව 27.78 නොව 24.42 ලෙස නිවරදි විය යුතු බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

ඒ අනුව සලකා බැලීමේ දී දැනට ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා තෝරාපත් කරගෙන ඇති අයදුම්පත්‍ර අංක 31 සහ 154 දරන ශිෂ්‍යයින්ගේ අවසාන මුළු ලකුණු සංඛ්‍යාව, කඩඉම් ලකුණ වූ ලකුණු 27ට වඩා අවම අගයක් ගන්නා බව නිරීක්ෂණය වේ.

එසේවුවද, 2024.04.04 සහ 2024.05.13 යන දිනයන්හිදී කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ වලදී ඉහත කී අයදුම්පත්‍ර අංක 31 සහ 154 දරන ශිෂ්‍යයින් දෙදෙනාගේ අදාළ සනාථ කිරීමේ ලේඛන සියල්ල විද්‍යාලයේ ලේඛනාගාරයේ පවතින බවට 1 වන වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කරමින් පරීක්ෂණය සඳහා සහභාගී වූ නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් ප්‍රකාශ කරන ලදි. එහෙත්, නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් 2024.03.15 දින පැවති පරීක්ෂණයේදී පැමිණිලිකරුවන්ගේ සහ අනෙකුත් ප්‍රශ්න සහගත ශිෂ්‍යයින්ගේ අදාළ ලේඛන සියල්ල ඇතුළත් ගොනු කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බවත්, විද්‍යාලය සතුව වෙනත් පිටපත් නොමැති බවත් ප්‍රකාශ කර තිබියදී විද්‍යාලයේ ලේඛනාගාරයේ අදාළ ලේඛන පවතින බවට ප්‍රකාශ කිරීම ගැටලු සහගත වූ නමුත්, එකී ලේඛනාගාරයේ තිබූ බව

පවසමින් නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලේඛන ද කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බලන ලදි. එහිදී එකී ලේඛන හුදු ඡායා පිටපත් විනා සහතික කළ පිටපත් නොවන බවත්, එකී ලේඛන ලබා දීමට පෙර කොමිෂන් සභාව වෙත ලබා දී තිබූ මුල් ශිෂ්‍ය වාර්තා පොත් සමඟ සසඳා බැලීමේ දී පසුව ඉදිරිපත් කළ ඉහත කී අයදුම්පත්‍ර අංක 31 සහ 154 දරන ශිෂ්‍යයින් දෙදෙනාගේ ශිෂ්‍ය වාර්තා පොත් වලට කොමිෂන් සභාව විසින් සනාථ කිරීමට ලේඛන නොමැති බවට දන්වා තිබූ සුදුසුකම් ඇතුළත් කරමින් ව්‍යාජ ලෙස සකස් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, 4 සිට 9 දක්වා වන පැමිණිලිකරුවන් විසින් 2024.03.28 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශ තුළ විද්‍යාලයේ Senior Steward නම් ලැයිස්තුවේ අවසාන අංකය වන 158 හිමි ශිෂ්‍යයා, ශිෂ්‍ය නායකයෙකු වශයෙන් තෝරාපත් කරගෙන ඇති නමුත්, එම ලැයිස්තුවේ 71, 90 සහ 97 යන ස්ථානවල සිටි ඔවුන් තේරීපත්ව නොමැති බවටත් දක්වා ඇත. මෙයට පිළිතුරු ලෙස 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් දක්වා ඇත්තේ Senior Steward ලේඛනය ඉදිරිපත් කර ඇත්තේ ශිෂ්‍යයින්ගේ නම් වල අකාරාදී අනුපිළිවෙළ අනුව විනා ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමාණයන් අනුව නොවන බව යි. එලෙස තේරීපත්වූ ශිෂ්‍යයාගේ වර්තමාන අයදුම්පත්‍ර අංකය 90 වන බවට පැමිණිලිකරුවන් විසින් කළ දැනුම්දීම මත එම ශිෂ්‍යයාගේ අයදුම්පත්‍රය සහ අනෙකුත් ලේඛන සහිත ගොනුව කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බැලීමේදී ඔහු හට විද්‍යාලය විසින් ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව නිවරදිව ලකුණු ලබාදී ඇති බවත්, එම ශිෂ්‍යයා විසින් ඔහු අයදුම්පත්‍රය තුළ සඳහන් කරන ලද සියලු සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ. එසේහෙයින් ඉහත කී අයදුම්පත්‍ර අංක 90 හිමි ශිෂ්‍යයා, ශිෂ්‍ය නායකයෙකු ලෙස තේරී පත්වීම සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් පවතින බව කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවේ.

තවද, පැමිණිලිකරුවන් විසින් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ වලදී නිරන්තරයෙන්ම ඉස්මතු කරන ලද කරුණක් වූයේ 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද ලකුණු ලබාදීමේ පටිපාටිය තුළ Mandatory Requirements යටතේ දක්වා ඇති අවශ්‍යතාවයන් අතරින් A/L Class teacher's recommendation යන්න සලකා බලා නොමැති බවත්, ඔවුන්ගේ පන්තිභාර ගුරුභවතුන් වෙතින් කිසිදු නිර්දේශයක් ලබාගෙන නොමැති බවත් ය. මේ සඳහා පිළිතුරු ලබාදෙමින් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ප්‍රකාශ කර ඇත්තේ සියලුම අයදුම්කරුවන් හට පන්තිභාර ගුරුභවතාගේ නිර්දේශය ලැබී ඇති බවයි. පැමිණිලිකරුවන්ගේ අයදුම්පත්‍ර පරීක්ෂා කිරීමේදී ඔවුන් සියලු දෙනාහට පන්තිභාර ගුරුභවතාගේ නිර්දේශය ලැබී ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද ලකුණු ලේඛනය පරීක්ෂා කිරීමේදී ශිෂ්‍ය නායක මණ්ඩලය තෝරාපත් කරගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාමාජිකයින් සිව්දෙනෙකුගෙන් සමන්විතව පැවතුණ බව නිරීක්ෂණය වුවද, ඇතැම්

ශිෂ්‍යයින් සඳහා එම සාමාජිකයන් සිව්දෙනා විසින්ම ලකුණු ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳව 2024.04.09 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව විසින් සිදු කළ විමසීමේ දී, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් 2024.04.29 දිනැති ලිපිය යොමු කරමින් මෙම සම්මුඛ පරීක්ෂණ බොහෝ වේලාවල්වල දී සවස්වනතුරුම පැවතුණු බවත්, එවැනි අවස්ථාවලදී අනපේක්ෂිත ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හට ඉන් බැහැර වීමට සිදු වූ බවත්, එවැනි අවස්ථාවලදී සම්මුඛ පරීක්ෂණ පවත්වන සාමාජිකයින් විසින් දෙනු ලැබූ ලකුණේ සාමාන්‍ය ලබාදෙන ලද බවත් දක්වා ඇත. කෙසේවුවද, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් සිව්දෙනා විසින් ලබාදෙනු ලබන ලකුණු ප්‍රමාණයන්, අයදුම්පත්‍රයට ලැබෙන ලකුණු මෙන් ස්ථිර අගයක් නොගන්නා බැවින් සහ පුද්ගලානුබද්ධ වන බැවින් සියලු සාමාජිකයින්ගේ ලකුණු ලබානොගෙන ගණනය කිරීම් සිදු කිරීම සාධනීය තත්ත්වයක් නොවන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

## නිගමනය

ඉහත දක්වන ලද සියලු කරුණු පිළිබඳව සලකා බැලීමේ දී 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් 2023/2024 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයට ශිෂ්‍ය නායකයින් තෝරාපත් කරගැනීමේ දී විවිධ අක්‍රමිකතාවයන් සිදු කර ඇති බව තහවුරු වේ.

එහිදී මූලික වශයෙන්ම විද්‍යාලය විසින් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය තේරීමේ දී අදාළ කරගනු ලැබූ ලකුණු ලබාදීමේ පටිපාටිය පිළිබඳව ශිෂ්‍යයින් හට පෙර වර්ෂවලදී මෙන් දැනුවත් නොකිරීම හේතුවෙන් එකී පටිපාටියෙහි විනිවිදභාවය ගිලිහී ඇති බව පැහැදිලි වේ. එසේම, විද්‍යාලය විසින් ලබාදෙනු ලැබූ අයදුම්පත්‍රය ද නිසි පරිදි සකස් වූවක් නොවන බවත්, ලකුණු ලබාදීමේ පටිපාටිය තුළ ලකුණු ප්‍රමාණයන් වෙන් කොට ඇති ඇතැම් සුදුසුකම් ඇතුළත් කිරීම සඳහා එකී අයදුම්පත්‍රය තුළ ස්ථානයක් වෙන්ව නොපැවති බවත් ඉහත සඳහන් කරුණු අනුව තහවුරු වේ.එසේම, අයදුම්පත්‍ර සඳහා ලකුණු ලබාදීමේ දී නිසි පරිදි සනාථ කිරීමේ ලේඛන පරීක්ෂා කර බලා ලකුණු ලබා දී නොමැති බව ද තහවුරු වේ.

එමෙන්ම, නිසි පරිදි සම්මුඛ පරීක්ෂණ සඳහා කාලවේලාවන් වෙන් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් පත් නොකිරීම හේතුවෙන් ඇතැම් සාමාජිකයින් සම්මුඛ පරීක්ෂණ අවසන් වීමට පෙර පිටව යාමෙන් ඇතැම් ශිෂ්‍යයින් හට සියලුම සාමාජිකයින්ගේ ලකුණු ලැබී නොමැති බව ද සනාථ වේ.

තවද, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් කොමිෂන් සභාව හමුවේ 2024.03.15 දින පැවති පරීක්ෂණයේ දී පැමිණිලිකරුවන්ගේ සහ අනෙකුත් ප්‍රශ්න සහගත ශිෂ්‍යයින්ගේ අදාළ ලේඛන සියල්ල ඇතුළත් ගොනු කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බවත්, විද්‍යාලය සතුව වෙනත් පිටපත් නොමැති බවත් ප්‍රකාශ කර තිබියදී, ඊට පසුව 2024.04.04 සහ 2024.05.13 දිනවලදී පැවති පරීක්ෂණ වලදී අයදුම්පත්‍ර 31 සහ 154 හිමි ශිෂ්‍යයින්ගේ ලේඛන ඇතුළත් ගොනු විද්‍යාලයේ ලේඛනාගාරයේ පවතින බවට ප්‍රකාශ කිරීම තුළින් විද්‍යාලය විසින් පරස්පර විරෝධී ප්‍රකාශ කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇති බවත්, කොමිෂන් සභාව වෙත මුලින් ඉදිරිපත් කරන ලද

ලේඛනයන්ගෙන් වෙනස් වූ පිළිගත නොහැකි ව්‍යාජ ලෙස සකස් කරන ලද ලේඛන පසුව ඉදිරිපත් කර ඇති බවත් ඉහත කරුණු සලකා බැලීමේ දී තහවුරු වේ.

තවද, 1 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) විසින් ප්‍රකාශ කර ඇති පරිදි 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ඔහුව මුල් අවස්ථාවේදීම ශිෂ්‍ය නායකයෙකු ලෙස තෝරා පත්කර නොගෙන අභියාචනයෙන් තෝරා පත් කරගෙන ඇත. එසේ තේරිපත් වූ බවට දැනුම්දූන් දිනට පසුදින ශිෂ්‍ය නායකයින් අතුරෙන් ඉහළ ශිෂ්‍ය නායක මණ්ඩලය (Top Board) තෝරාගැනීම සඳහා වන ඡන්දය පැවති බැවින් ඔහු ශිෂ්‍ය නායකයෙකු ලෙස තේරිපත් වූ බවට අනෙක් ශිෂ්‍යයින් හට දැනුවත් වීමට ප්‍රමාණවත් කාලයක් නොලැබුණු බැවින් ඡන්දයේදී ඔහු හට අසාධාරණයක් සිදු ව තිබිය හැකි බවට නිරීක්ෂණය වුවද, ඔහු ශිෂ්‍ය නායකයෙකු ලෙස තේරි පත් වී ඇති බැවින් 1 වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් සිදු වී ඇති බවට අනාවරණය නොවේ.

තවද, ඉහතින් සාකච්ඡා කර ඇති පරිදි 2, 4, 6 සහ 7 වන පැමිණිලිකරුවන් හට නිසි පරිදි ලකුණු ලබා දී නොතිබීම තුළින් පරිපාලනමය වශයෙන් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් නොසැලකිල්ලෙන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. එසේ නමුත්, 2, 4, 6 සහ 7 වන පැමිණිලිකරුවන් හට ලබා දී නොමැති ලකුණු ප්‍රමාණයන් නැවත ලබා දුන්න ද, ඔවුන් හට අදාළ කඩඉම් ලකුණු සීමාවට පැමිණීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වන බැවින් 2, 4, 6 සහ 7 වන පැමිණිලිකරුවන්ගේ ද මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් සිදු වී ඇති බවට අනාවරණය නොවේ.

එසේම, 3, 8 සහ 9 වන පැමිණිලිකරුවන්ගේ අයදුම්පත්‍ර සහ ඊට අදාළ ලේඛන පරීක්ෂා කිරීමේ දී ඔවුන් හට නිසි පරිදි ලකුණු ලබා දී ඇති බව නිරීක්ෂණය වන බැවින් 3, 8 සහ 9 වන පැමිණිලිකරුවන්ගේ ද මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් සිදු වී ඇති බවට අනාවරණය නොවේ.

එසේ වුවද, 5 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 67) හට හිමි විය යුතු ලකුණු නිසි පරිදි මුල් අවස්ථාවේදී මෙන්ම අභියාචනයේ දී ද ලබා නොදීම හේතුවෙන් ශිෂ්‍ය නායකයෙකු ලෙස තේරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කිරීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය වන මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති 5 වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය වීමක් සිදු වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් කර සිටී.**

1. 5 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 67) වන එම්. පී. ජයවර්ධන යන ශිෂ්‍යයා හට හිමි විය යුතු ලකුණු ප්‍රමාණය 27.41 ලෙස නිවරදි කළ විට ඔහු කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 27 ඉක්මවන බැවින් ඔහුව ශිෂ්‍ය නායකයෙකු ලෙස තෝරාපත් කර ගැනීමට 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් කටයුතු කළ යුතු ය.

2. 1 වන පැමිණිලිකරු (අයදුම්පත්‍ර අංක 136) වන එම්. පත්බේරිය යන ශිෂ්‍යයා විසින් ප්‍රකාශ කර ඇති පරිදි ඔහු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ හේතුව මත, විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් ඔහු හට විවිධ වෙනස්කම් සහ පීඩනයන් සිදු කිරීම සම්බන්ධව විද්‍යාලය වෙත ද පැමිණිලි කර ඇති බව සඳහන් කර ඇති අතර එකී පැමිණිල්ල පිළිබඳව 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කරුණු සොයා බලා එවැනි තත්ත්වයන් තවදුරටත් ඇති වීම වැළැක්වීමට පියවර ගත යුතු ය.

3. මේ වන විට ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයට තේරී පත් වී සිටින අයදුම්පත්‍ර අංක 31 සහ 154 දරන ශිෂ්‍යයින් දෙදෙනාගේ අයදුම්පත්‍ර සහ අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීමේ දී ශිෂ්‍ය නායක පත්වීම් ලැබීමේ කඩඉම් ලකුණු සීමාව ලබා ගැනීමට ඔවුන් අපොහොසත් වන බව නිරීක්ෂණය වන බැවින් හා ඔවුන්ට ශිෂ්‍ය නායකයන් ලෙස පත්වීමට ලකුණු නොපවතින බැවින් ඔවුන්ගේ පත්කිරීම් සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් විද්‍යාලයේ ගුරු මණ්ඩලය සමඟ සාකච්ඡා කර යම් පියවරක් ගත යුතු ය.

4. අයදුම්පත්‍ර අංක 31 සහ 154 දරන ශිෂ්‍යයින් දෙදෙනාට අදාළව 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලේඛන ඉදිරිපත් කිරීමේදී මුල් අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද ලේඛන පසුව වෙනස් කොට දෙවන වර ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වන බැවින්, එලෙස ව්‍යාජ ලේඛන සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1 වන වගඋත්තරකාර පාර්ශවය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, එහි නිගමනයන් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

5. 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/රාජකීය විද්‍යාලය විසින් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය පත් කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ වන විට නිකුත් කර ඇති ශිෂ්‍ය නායකයින් පත්කිරීමේ මාර්ගෝපදේශ මාලාව අනුව කටයුතු කළ යුතු අතර එකී මාර්ගෝපදේශ මාලාව තුළින් ද දක්වා ඇති පරිදි පාසල් අධ්‍යාපනය හදාරන කාලසීමාව තුළ දී පමණක් ශිෂ්‍යයින්, ශිෂ්‍ය නායක තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතු ය.

6. ඉහත නිගමනයන් අනුව 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/රාජකීය විද්‍යාලය ශිෂ්‍ය නායකයන් පත් කිරීමේ දී අනුගමනය කර ඇති ක්‍රියාවලිය අවිධිමත් හා විවෘත භාවයකින් තොර වූවක් බව පෙනී යන අතර, ඒ නිසාම මෙම ශිෂ්‍ය නායක පත්වීම් සම්බන්ධව කර ඇති නිශ්චිත නිර්දේශ හැර මූලික අයිතිවාසිකම් උල්ලංඝණයන් යටතේ සමස්තය සම්බන්ධව නිර්දේශයක් කිරීමට කොමිෂන් සභාව අදහස් නොකළ ද ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් නිවරදි කරගැනීම 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/රාජකීය විද්‍යාලයේ වගකීම බව දැඩිව අවධාරණය කරනු ලබයි. එසේම, ශිෂ්‍යයින්ට බලපාන්නා වූ මෙවැනි විශේෂ ක්‍රියාකාරකම් වලදී වඩා වගකීමකින්

හා සැලකිලිමත් ලෙස කටයුතු කිරීමට 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/ රාජකීය විද්‍යාලය විසින් වගබලා ගත යුතු ය.

7. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ශිෂ්‍ය නායකයින් පත්කිරීමේ මාර්ගෝපදේශ මාලාවට අනුව 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කො/රාජකීය විද්‍යාලය විසින් කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව 2 වන වගඋත්තරකාර පාර්ශවය වන අධ්‍යක්ෂ, ජාතික පාසල් විසින් නිසි ලෙස අධීක්ෂණය කළ යුතු ය.

2024.09.08 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරුවන් විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 1. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්, - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.